## නාවික සංවර්ධන අරමුදල - 2012

----------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මතය ව්‍යාවනය</u>**

මෙම වාර්තාවේ 1.2.2 ජේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම</u>**

1.2.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

ජනාධිපති ලේකම් කාර්යාලයට යවා තිබුණු රු.මිලියන 367 ක් හා රාජ්‍ය ආයතන 03 කින් ලැබිය යුතු එකතුව රු.මිලියන 93 ක් ශේෂපත්‍රයේ වත්කම් යටතේ දක්වා තිබුණි. එක් රාජ්‍ය සංස්ථාවකින් ලැබිය යුතු රු.මිලියන 55 කින් රු.මිලියන 50 ක් වර්ෂ 15 ක සිට පැවැත එමින් පවතින අතර ඉතිරි රු.මිලියන 05 වර්ෂ 5 සිට වර්ෂ 10 අතර කාල පරාසයක සිට පැවැත එමින් පැවතුණි. මෙම මුදල් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් අරමුදල විසින් ගෙන නොතිබූ අතර ඒ සඳහා බොල්ණය ප්‍රතිපාදනද සිදුකර නොතිබුණි.

1.2.2 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

රු.110,941 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන සහ භෞතික සත්‍යාපන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් එම වත්කම් සතුටුදායක ලෙස සත්‍යක්ෂණය කිරීමට විගණනයේදී නොහැකි විය.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුනි. මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු සමුච්චිත අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේදී මගී නැව් සේවයෙන් ආපසු ලැබී තිබනු රු.13,523,734 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව අරමුදලේ සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ක්ෂයවීම් වශයෙන් රු.19,615 ක වියදමක් පමණක් වීම නිසා වර්ෂයේ ඌනතාවය රු.19,615 ක් වී තිබුණි. ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ආදායම් හා

වියදම් ප්‍රකාශනය අනුව රු.23,108,378 ක අතිරික්තයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,127,993 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>කාර්ය සාධනය</u>**

කොමිස් මුදල් අයකර ගැනීමට විරුද්ධව නැව් නියෝජිත ආයතන විසින් අරමුදලට එරෙහිව අධිකරණයේ පවරන ලද නඩුවක් මගින් මුදල් අයකිරීම වලක්වන නියෝගයක් 2006 වර්ෂයේ දී ලබා දී තිබීම හේතුවෙන් අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවයෙන් ඉකුත් වසර 6 තුළ කිසිදු ආදායමක් ඉපයීමට නොහැකි විය. තවද අරමුදල සතුව ස්ථාවර වත්කම් ලෙස පරිගණක හා ජායා පිටපත් යන්ත්‍ර කිහිපයක් පමණක් තිබුණු බැවින්, කවරාකාරයෙන් හෝ මෙහෙයුම් කටයුත්තක් ආරම්භ කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට, අරමුදලට ගැටළු සහගත වී තිබීමෙන් කිසිදු කාර්ය සාධනයක් වාර්තා කිරීමට නොහැකි වී තිබුණි.

3.2 **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

අරමුදල විසින් 2011 ජුනි මාසයේ පිළිවෙලින් රු.35,000,000 ක් සහ රු.25,000,000 ක් වශයෙන් එකතුව රු.60,000,000 ක් නාවික මෙහෙයුම් පර්යන්තයකට අවශ්‍ය උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රාජ්‍ය නාවික සමාගමකට ලබාදී තිබුණි. එම මුදලින් රු.46,476,266 ක් වැයකර භාණ්ඩ මිලදී ගෙන තිබුණු අතර ශේෂය වූ රු.13,523,734 ක් වූ මුදල මාස 14 කට වැඩි කාලයක් නිෂ්කාර්යව බාහිර ආයතනයක තිබීමට ඉඩ දී පසුව එම මුදල 2012 අගෝස්තු 12 වන දින භාණ්ඩාගාරයට ආපසු යවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මගී පර්යන්තයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන වියදම් දැරීමට ලබාදී තිබූ මුදලින් රු.29,686,523 ක් ගොඩනැගිලි කුලී , ප්‍රවාහන, කම්කරු වේතන , විදුලි , දුරකථන හා වෙනත් සුළු වියදම් වැනි පුනරාවර්තන වියදම් වෙනුවෙන් වැයකර තිබුණි.

(ආ) එකතුව රු.11,883,238 ක් වූ මුදලක් වැයකර මිලදී ගෙන තිබූ ගමන් මලු පිරික්සුම් උපකරණ (Baggage Scanner) ලෝහ භාණ්ඩ හඳුනාගැනීමේ උපකරණ (Metal Detector) සහ යකඩ ට්‍රොලි කිසිදු පයෝජනයක් ලබා නොගෙනම බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අය කිරීමකින් තොරව ලබා දී තිබුණි.

(ඇ) එකතුව රු.4,906,505 ක් වූ පරිගණක හා කාර්යාල ලී බඩු රේඛීය අමාත්‍යාංශයේ සහ රාජ්‍ය නාවික සංස්ථාවක ප්‍රයෝජනය සඳහා ලබා දී තිබුණි.

එහෙයින් මගී පර්යන්තයක වැඩි දියුණු කිරීම සඳහා වැය කර තිබූ රු.46,476,266 ක් වූ මුළු මුදලම අදාල කාර්යයට නොයොදවා වෙනත් කාර්යයක් සඳහා යොදවා තිබීමෙන් අදාල මුදල අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට යොදවා නොතිබුණි.

3.3 <u>සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම</u>

ස්ථාවර වත්කම් කිහිපයක් හා අයනොවන ණය ගැතියන් කිහිපයකින් සමන්විත අරමුදලක කිසිදු ක්‍රියාකාරීත්වයක් නොතිබෙන බැවින් අරමුදලට අදාලව සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

4. <u>පද්ධති හා පාලනයන්</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැතියන්
(ඇ) ස්ථාවර වත්කම්